# ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු අභ්‍යාසලාභීන්ගේ සීමාවාසී ගුරු පුහුණුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්.

(විද්‍යාපීඨ දෙකක් සහ එක් පාඨමාලාවක් ඇසුරෙන්)

කේ.ඒ. දයා ශාන්ති කළුආරච්චි
වාණිජ්‍යවිද්‍යාවේදී (විශේෂ) උපාධිය
පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමා
අධ්‍යාපනපති උපාධිය

UCLIB
554166

m 755

University of Colombo Library

කොළඹ විශ්වවිද්‍යාලයේ
අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා
ඉදිරිපත් කරන නිබන්ධනය. 99/M.phil/10
2007

# සාරාංශය

ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පිහිටුවා විසි වසරකට ආසන්න කාලයක් ගත වී ඇත. ආරම්භයේදී මෙම අධ්‍යාපන පීඨ සියලු අංග වලින් කැපී පෙනෙන ආයතනය ලෙස ගුරු අධ්‍යාපන ක්ෂෙත්‍රයේ නමක් දිනා ගැනීමට සමත් විය. අ.පො.ස උසස් පෙළ සමත් විශ්ව විද්‍යාලයට ඇතුලත් වීමේ සුදුසුකම් ලත් තරුණ ගුරු සිසුන් අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගැනේ. මේ පුහුණුවේ ඉතා වැදගත් අංගය සීමාවාසි ගුරු පුහුණුවය. මෙම අධ්‍යනයෙන් විමසා බලනු ලබන්නේ සීමාවාසි ගුරු පුහුණුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු වන ආකාරය පිළිබඳවයි. මීට ඉහත ද ප්‍රායෝගික පුහුණුව පිළිබඳ පර්යේෂණ කිහිපයක් කර තිබුණත් සීඝ්‍රයෙන් නවීකරණය වන ප්‍රායෝගික පුහුණුවේ වර්තමානය පිළිබඳ විමසා බැලීම කාලෝචිත වේ.

ගුරු ආධුනිකයෙන් වශයෙන් ක්ෂෙත්‍රයට පිවිසෙන ගුරුවරුන් පූර්ව සේවා ගුරු පුහුණු පාඨමාලාවන් මගින් යථායෝග්‍ය පරිදි පුහුණු කිරීම සිදු විය යුතුව ඇත. න්‍යාය වූ දැනුම් සම්භාරයක් හා වෘත්තියේ ප්‍රායෝගික පුහුණුවක් ද අවශ්‍ය වේ.

සංවර්ධිත රටවල් ගුරු පුහුණු පාඨමාලා, ප්‍රථම උපාධියකින් පසුව විශ්ව විද්‍යාල වලට අනුබද්ධිතව වැඩි ප්‍රායෝගිකත්වයකින් සිදු කරනු ලැබේ. නමුත් සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටවල ගුරු පුහුණුව, පූර්ව සේවා ගුරු පුහුණු ආයතන යටතේ, වර්තමානයේ වැඩි න්‍යායාත්මක පුහුණුවකට බරව සිදු කරනු දක්නට ලැබේ.

අධ්‍යාපන ක්‍රියාවලියක් මෙසේ විය යුතු යැයි තීරණය කිරීමේදී හෝ පවත්නා ක්‍රමය වෙනස් කිරීමේ දී හෝ ප්‍රතිසංවිධානය කිරීමේදී හෝ පවත්නා ක්‍රමය පිළිබඳ විමර්ශනාත්මකව කරුණු පැහැදිලි කර ගැනීම අවශ්‍ය වේ. එහෙත් මෙම අධ්‍යයනයෙන් ප්‍රයන්ත දැරුවේ අධ්‍යාපන විද්‍යාපීඨවල ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා සීමාවාසි ගුරු පුහුණු ක්‍රියාවලිය පිළිබඳ ක්‍රියාත්මක ස්වභාවය හා එහි අරමුණු ඉටු වන ප්‍රමාණය හෙළි කර ගැනීමටයි.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු අභ්‍යාසලාභීන්ගේ සීමාවාසි ගුරු පුහුණුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරය විමසීම යන මාතෘකාව ඇසුරෙන් මෙහෙය වූ මෙම අධ්‍යයනයේ මූලික අරමුණු වූයේ ගුරු අභ්‍යාසලාභීන්ගේ පන්ති ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු, විෂය සමගාමී කටයුතු පාසල් සංවර්ධන වැඩ සටහන් සැලසුම් කරන හා ක්‍රියාත්මක කරන

ආකාරය, සොයා බැලීම පාසල් පරිපාලන හා කළමණාකරණ කටයුතු වලට සහය වන අයුරු, පාසල හා සම්බන්ධ ප්‍රජා ව්‍යාපෘති ගුරු අභ්‍යාසලාභින් සැලසුම් කරන ආකාරය, ගුරු අභ්‍යාසලාභින් ගුරු භූමිකාව හා වෘත්තිය වගකීම් අවබෝධ කරගෙන, ගුරු ආචාර ධර්ම පිළිපදින ආකාරය, ගුරු අභ්‍යාසලාභින් ස්වයං ඇගයීමේ හා පර්යේෂණාත්මක අත්හදා බැලීම්වල නියැලීම සහ පාසල්වල ගුරු පුහුණුවේ නිරතවන විට මුහුණපාන ගැටළු විමසා බැලීම හා ඒ සඳහා ගතහැකි පියවර විමසා බැලීමයි.

අධ්‍යාපන විද්‍යාපීඨ පාඨමාලා කාලය තුළ සීමාවාසි ගුරු පුහුණු ක්‍රියාවලිය තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඒ ආකාරයෙන්ම ඉටු වේ ද යන්න විමර්ශනය කරමින් පූර්ව සේවා ගුරු පුහුණු ක්‍රමයට අදාළ අන්දමින් ආධුනික ගුරුවරුන් පුහුණු කිරීම සඳහා යොදා ගන්නා වෑයම කොතෙක් දැයි විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

තවද, සීමාවාසි ගුරු පුහුණුවේ ප්‍රබලතා හඳුනා ගෙන ඒවා තවදුරටත් සංවර්ධනය කර ගැනීමටත්, දුබලතා මඟ හරවා ගැනීමටත් යෝජනා ඉදිරිපත් කිරීම ද, එමගින් වඩා කාර්යක්‍ෂම ඵලදායි ක්‍රියාමාර්ග ගැනීමටත්, වැඩි දුරටත් අවධානය යොමු කළ යුතු අංග හඳුනා ගැනීමටත් මෙම අධ්‍යයනය කාලෝචිත වේ.

ඉහත අරමුණු ඉටුකර ගැනීමට 2002 - 2004 වසරවල පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට හා හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඇතුළත් වූ ගුරු සිසු 200ක නියැදියක්ද, කථිකාචාර්යවරුන් 20ක්ද, විදුහල්පතිවරුන් 50ක්ද, ප්‍රමුඛාචාර්යවරුන් 50ක්ද, කාර්යාල කටයුතුවලට සහය වන ගුරුවරුන් 50ක්ද, පංති භාර ගුරුවරු 50ක ස්ථරගත අහඹු නියැදියක් ද යොදා ගෙන අධ්‍යයනය මෙහෙය වනු ලැබිය.

අදාළ දත්ත රැස්කිරීමේදී විවිධ රටවල හා ශ්‍රී ලංකාවේ ප්‍රායෝගික ගුරු පුහුණුවේ ස්වභාවය විමසීම සඳහා ලිඛිත මූලාශ්‍ර භාවිත කෙරුණි. ගුරු සිසු ප්‍රශ්නාවලිය සැකසීම අරමුණු පදනම් කරගෙන සිදුවූ අතර අහඹු ලෙස තෝරාගත් සිසුන් 50 වෙත නියාමක ප්‍රශ්නාවලිය ඉදිරිපත් කිරීමෙන් ලද ප්‍රතිඵල ඇසුරින් අවසන් ගුරු සිසු ප්‍රශ්නාවලිය සැකසිණි. කථිකාචාර්යවරුන්ගේ ප්‍රශ්නාවලිය ද ගුරු සිසු ප්‍රශ්නාවලිය පදනම් කරගෙන සැකසිණි. විදුහල්පතිවරුන්, ප්‍රමුඛචර්යවරුන්, කාර්යාල කටයුතුවලට සහාය වන ගුරුවරුන් පංතිභාර ගුරුවරුන් සඳහා වූ සම්මුඛ සාකච්ඡා උපලේඛනය සැකසීම පෙර පර්යේෂණ තොරතුරු ඇසුරින් සිදු කෙරිණි. පළමුවන පරිච්ඡේදයෙන් පැරණි ශ්‍රී ලංකාවේ ප්‍රායෝගික ගුරු පුහුණු

ක්‍රියාවලිය යටත් විජිත යුගයේ ප්‍රායෝගික ගුරු පුහුණු ක්‍රියාවලිය, 1950න් පසු ප්‍රායෝගික ගුරු පුහුණුවේ ඇති වූ නව ප්‍රවණතා, උපාධිධාරීන් සඳහා විශ්ව විද්‍යාල ගුරු පුහුණුව වෙනත් ආයතනවල ගුරු පුහුණුව පූර්වසේවා ගුරු පුහුණු ආයතනය ලෙස අධ්‍යාපන විද්‍යාපීඨ සහ සීමාවාසී අවධිය සහ එහි අරමුණු, ප්‍රයෝගික ගුරු පුහුණුවේ වර්තමාන එළඹුම දක්වා වර්ධනය වූ ආකාරය පිළිබඳ තොරතුරු විග්‍රහ කෙරුණි.

දෙවන පරිච්ජේදයෙන් ලෝකයේ විවිධ රටවල් ගුරු පුහුණුව පිළිබඳ කරනු ලැබූ පර්යේෂණ සහ ශ්‍රී ලංකාවේ මේ පිළිබද කරන ලද පර්යේෂණ නිගමන සඳහන් කරන ලදි

තුන්වන පරිච්ජේදය අධ්‍යයන ක්‍රමවේදය පිළිබද තොරතුරු දැක්වීම සඳහා වෙන්විණි. මෙහි දි අධ්‍යයන පරිස්ථිතය, අධ්‍යයන අරමුණු, ජනගහනයෙන් නියැදිය තෝරා ගැනීම, නිල්පත දත්ත රැස් කිරීමේ කුමවේදය අධ්‍යයනය මෙහෙයවන ලද ආකාරය පර්යේෂණ වලංගුතාවය හා විශ්වාසයතාවය දත්ත විශ්ලේෂණය හා අධ්‍යයන සීමා සදහා වෙන් විය.

හතරවන පරිජේදයෙන් තොරතුරු පදනම් කරගෙන ලබාගත් දත්ත වගු, ප්‍රතිශත ඇසුරින් සරල සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම ඇසුරින් විශ්ලේෂණය කෙරුණි.

දත්ත විශ්ලේෂණය ඇසුරින් නිගමනය හා යෝජනා ඉදිරිපත් කිරීම පස්වන පරිච්ජේදයෙන් සිදු කෙරුණි. එම නිගමන නම් විවධ වර්ගයේ පාසල්වල අභ්‍යන්තර පරිපාලන හෝ කළමනාකරණ ව්‍යුහය පාසලේ ධුරාවලිය, පරිපාලන වාර්තා පිළියෙල කිරීම සිසුන් තෝරාගැනීම හා ඇතුළත් කරගැනීම, ලිපිගොනු හා වාර්තා තැබීම, ඇගයීම් වාර්තා තැබීම, මානව හා භෞතික පරිසරය, පාසල ආශ්‍රිතව ප්‍රජාව සමඟ සම්බන්ධතා පැවැත්වීම පාසල්වල කාලසටහන් හා වාර්ෂික වැඩ සැලැස්ම සැකසීම පිළිබඳ දැනුම අපේක්ෂිත මට්ටමෙන් ලැබී නොමැත. පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් කටයුතුවල දී මූලාශ සම්පත් ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිතය, ශිෂ්‍යයින්ගේ විවධත්වය අවබෝධ කර ගැනීම හා තම ඉගැන්වීම් ක්‍රම ශිල්ප භාවිතය හා පන්ති කළමනාකරණය පිළිබඳ අවශ්‍ය ප්‍රමාණයට දැනුවත් භාවයන් ලැබී නොමැත. විෂය සමගාමී කටයුතු ප්‍රමාණවත් මට්ටමෙන් සිදු වන බව, ගුරු භූමිකාව ගුරු වෘත්තිය වගකීම්, ගුරු ආචාර ධර්ම හා පෞරුෂ ගුණාංග වලින් යුත් ගුරුවරයෙකු ලෙස පද්ධතිය තුළ හැසිරීමට කරනු ලබන මගපෙන්වීම පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් ලැබී ඇත. ස්වයං ඇගයුම් සඳහා ඇගයුම් උපකරණ භාවිතය, ප්‍රත්‍යාවේක්ෂණ ජ'නල් අඛණ්ඩව භාවිත කිරීම, පර්යේෂණ කාර්යයෙහි යෙදීම ප්‍රමාණවත් මඟ පෙන්වීමක් සිදුවී නොමැත. ප්‍රමාණවත් ආකාරයට ගුරු සිසුන් අධීක්ෂණය කරන බවක් හෝ ඔවුන්ට අවශ්‍ය උපදෙස්

නොලැබෙන බව කථිකාචාර්යවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ, ප්‍රමුඛාචාර්යවරුන්ගේ, සහ පාසලේ අනෙකුත් ගුරුවරුන්ගෙන් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නොවන බවද, පූර්ව සේවා ගුරු පුහුණුව වැඩි ප්‍රයෝගික බවකින් යුක්ත විය යුතු බව හා ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන අංශ දෙකම සංවර්ධනය විය යුතු බව නිගමනය කළ හැකිය. මෙම නිගමනය දෙස් විදෙස් පර්යේෂණ සාහිත්‍ය මඟින් තහවුරු කර ඇත. ගුරු සිසුන් සඳහා පවත්වන සැසි නවීන ඉගැන්වීමේ ක්‍රම, ප්‍රායෝගික ඉගැන්වීම නවීකරණය, නව තාක්ෂණය භාවිතය, ප්‍රතිපෝෂණයට, පර්යේෂණ කුසලතා සංවර්ධනය හා සන්නිවේදන කුසලතා දියුණු කිරීම සඳහා ඉවහල් නොවීම අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු පුහුණුවේ අරමුණු පිළිබඳ ගුරුවරුන්ගේ හා විදුහල්පති වරුන්ගේ දැනුවත් භාවය ප්‍රමාණවත් නොවීම තවත් නිගමනයකි.

සම්ප්‍රදායික ගුරු පුහුණුව වෙත යොමු නොවී පවතින සීමාවාසි ගුරු පුහුණුව වර්තමාන ලෝකයට ගැලපෙන ලෙස නවීන ගුරු පුහුණු ශිල්ප ක්‍රම වෙත යොමු වෙමින්, ගුණාත්මක භාවය ආරක්ෂා කරගනිමින් වැඩි ප්‍රයෝගිකත්වයකින්, ගුරු පුහුණුව සඳහා සම්බන්ධ වන සියලුම පාර්ශවයන්ගෙන් උපරිම සහයෝගය ලබාගනිමින් සීමාවාසි ගුරු පුහුණුවේ අරමුණු ඉටුවන ආකාරයට නිරන්තර අධීක්ෂණයෙන් යුත් ක්‍රියාවලියක් බවට පරිවර්තනය කළයුතු බවට යෝජනා කෙරිණි.

# ABSTRACT

Twenty years have lapsed after the establishment of National Colleges of Education in Sri Lanka. These National Colleges of Education's have been glorified distinctively in the field of teacher education in all aspects. The youthful students who qualified for University entrance are enrolled as prospective teachers. One of the main features of this teacher training program is the internship. This study examines how the anticipated goals and objectives of the internship teacher training are achieved. Though formerly of several researches on Practical Teacher Training had been carried out, it is timely needed to examine the present scenario of the fast modernizing entrants to the teaching profession as norices or apprentices should properly be trained by means of pre-service teacher training programs. A volume of adaptable knowledge of learning and practical training are needed. Teacher training courses in developed countries are being held for the graduates of the Universities after the first degree being accredited / affiliated to the Universities with a more weight-age on the practical parts. But, however, in developing countries such as Sri Lanka, teacher training as is apparent, is carried out with a more weight-age to the theoretical training.

It is required to investigationally define the prevalent system in deciding how the education process should be or, changing the prevalent system or reorganizing it. However this study make attempts to identifying how prevalent internship programmes in operation are conducted and to bring forth the volume of how the said objectives are achieved. Prime objective of this study stemming from the topic " Reviewing of the Ways and Means of improving the Anticipated Goals of Internship Training of Colleges of Education" is examined. With regard to student teachers' teaching – learning process, extra curricular activities, planning and implementing the school development projects, assistance extended towards school administration and management, Community project planning and implementation, understanding, following and observing the roles, responsibilities and ethics, this self-assessment and research experiments and the problems faced in practical teaching and examine the possible remedial measures.

The secondary objective of this study is to examine the extent the attempt of training apprentice teachers by means of methodology of pre-service teacher training and also by way of looking at whether the anticipated objectives are achieved as required. Moreover, this study would be timely beneficial for the improvement of strengths by identifying them. Coming out with proposals for anneillmen of weakness by identifying them; and for taking effective measures for the productivity through it and identifying the areas to which more attention is needed.

In order to achieve the said objectives, this study was carried out by selecting a stratified random samples of 200 prospective teachers entered into Pulathisipura National Colleges of Education, and Hapitigama National Colleges of Education in 2002 – 2004, 20 lecturers, 50 principles, 50 mentors and 50 teachers assisting office work in schools.

In collecting data, documentary proofs were used to review the nature of the practical teacher training in Sri Lanka and in developed countries. The preparation of the questionnaire meant for prospective teachers was based on the objectives and the final questionnaire was prepared after a pilot test which was administered to randomly selected 50 students. The questionnaire meant for lecturers was prepaid based on the questionnaire prepared for prospective teachers. The interview should meant for principles and mentors, teachers assisting the teachers for office work at schools were prepared being on information of former researches.

Information and details of practical teacher training process in Ancient Sri Lanka, Practical teacher training process during colonial era, New trends in practical teacher training after 1950, Teacher training at Universities for graduates, teacher training at other institutes, National Colleges of Education as pre-service teacher training institutes that internship period, their objectives and development of teacher training to the present day are examined in the first chapter.

In the second chapter, the findings of the research on teacher training in various countries of the world and in Sri Lanka have been stated.

The third chapter is allotted for the limitation of the methodology of the study. There include places of study, objectives of the study, sampling out of population, blue print, methodology of data collection, how the study was carried out, validity and reliability of the study, data analysis and limits of the study.

Data tables obtained from information have been expostulated by mean of simple statistical methodology in the third chapter.